**ශීර්ෂය 302 සමූපකාර සේවක කොමිෂන් සභාව**

**---------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

සමූපකාර සේවක කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදි රු.448,620ක් වූ අත්තිකාරම් අයකර ගැනීම් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුල වැටුපෙන් අයකරගන්නා ලද අත්තිකාරම් මුදල් මාස්පතා මහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ප්‍රේෂණය කරන බැවින් අත්තිකාරම් අයකර ගැනීම් ශේෂය මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස හඳුනාගැනීමට කටයුතු කර නොමැත. ඒසීඒ 5 ආකෘතිය අනුව වර්ෂය තුල මුදලින් අත්තිකාරම් අයකර ගැනීම රු.793,820 ක් වේ. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කිරීමට වග බලා ගත යුතුයි. |
| (ii) | අත්තිකාරම් ගෙවීම් රු.686,641 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.414,331 ක් ලෙස රු.272,310 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඒසීඒ 5 ආකෘතිය අනුව වර්ෂය තුල මුදලින් අත්තිකාරම් ගෙවීම රු.414,331 ක් වන බැවින් එම අගය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුයි. |
| (iii) | වෙනත් වැය ශිර්ෂ වෙනුවෙන් දරන ලද රු.176,310ක වියදම මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ ශේෂය වන රු.176,310 පියවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලබාදුන් ප්‍රතිපාදන මත 2021 ඔක්තෝබර් මස ගිණුම් සාරාංශය මඟින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | භෞතික වත්කම් ඉදි කිරිම හෝ මිල දී ගැනිම හා වෙනත් ආයෝජන අත්කර ගැනිම් වටිනාකම රු.1,026,019 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.1,099,150 ක් ලෙස රු.73,131 ක් වැඩියෙන් දක්වා තිබුණි. | කාර්ය මණ්ඩල පුහුණු වැය විෂයය මගින් දරන ලද රු.73,131, ක් වූ වියදම මානව ප්‍රාග්ධන මත වන ආයෝජනයක් ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ දක්වා ඇත. | ගිණුම්වල නිවැරදි වටිනාකම දැක්වීමට වගබලා ගත යුතුයි. |

**(ආ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශය**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය<br>------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------- | නිර්දේශය<br>-------------------- |
|---|---|---|---|
| **(i)** | අනෙකුත් ශිර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් දරන ලද රු.176,310 ක වියදම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | රු.176,310ක අගය අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ ගැලපී ඇති අයුරු ඉදිරිපත් කර තිබුණි. | ගිණුම් මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුය. |
| **(ii)** | අනෙකුත් ශිර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරිම් රු.1,481,246 ක් වුවද, අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.863,736 ක් ලෙස දක්වා තිබිමෙන් රු.617,510 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රු.1,481,246 ක අගය ගැලපී ඇති අයුරු ඉදිරිපත් කර තිබුණි. | - එම - |

| | | | |
|---|---|---|---|
| **(iii)** | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 06 ඡේදය මඟින් හඳුන්වා දී ඇති ආකෘතියේ නොමැති මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල අත්තිකාරම් "බී" ගිණුමට ලැබීම් රු.793,820 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ගලපා තිබුණි. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය වඩාත් පැහැදිලිව ඉදිරිපත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ අත්තිකාරම් බී ගිණුමට ලැබීම් වෙනම ම දැක්වීමට කටයුතු කරන බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුය |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 වියදම් කළමනාකරණය**

-------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 සිට සියයට 75 දක්වා වූ පරාසයක ඉතිරිවීම් පැවතුණි. | **1101**<br>--------<br>පැවති වසංගතය නිසා සංචරණ සීමා පැන වූ කාලය තුල කාර්යාල භෞතිකව වසා තැබීම හා නිලධාරීන් සීමිතව කැඳවීම.<br>**1302**<br>-------<br>මෙම වැය විෂය යටතේ වූ වියදම් අපේක්ෂිත පරිදි ඇති නොවීම හේතුවෙන් ප්‍රතිපාදනය ඉතිරිවීම සිදුව ඇත.<br>**1303**<br>-------<br>මෙම වැය විෂය යටතේ වූ වියදම අපේක්ෂිත පරිදි ඇති නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම සිදුව ඇත. | ප්‍රතිපාදිත මුදල වර්ෂය තුල උපයෝජනය කිරීමට කටයුතු කල යුතුයි. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ඔක්තෝම්බර් 26 දිනැති 2021/02 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 4.5 ඡේදය ප්‍රකාරව පරිපූරක ගිණුම් සාරාංශ මඟින් භාණ්ඩාගාරයට වාර්තා කර නොමැති කිසිම බැඳීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුල නිරවුල් නොකල යුතු බව දක්වා තිබුණද 2021 වර්ෂයට අදාළ ගොඩනැඟිලි කුලී රු.225,000 ක් 2022 වර්ෂය තුල ගෙවා තිබුණු අතර එය 2021 වර්ෂයේ බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ පෙන්නුම් කර නොතිබුණි | 2021 දෙසැම්බර් මස ගොඩනැගිලි කුලී වියදම වූ රු.225,000 අතපසුවීමකින් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ පෙන්නුම් කර නොමැත. | මාර්ගෝපදේශ උපදෙස් පරිදි ගිණුම් පිළියෙල කල යුතුය. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 23 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 17 ක් වූයෙන් පුරප්පාඩු 06 ක් පැවතිණි. | අදාල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇත | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුයි. |